3) I **ප්‍රශස්ති කවි**

බුදුන්, දෙවියන්, රජවරුන් සහ රදල ප්‍රභූන් උදෙසා ගුණ වර්ණනා කරමින් ගායනා කරන කවි විශේෂයක් බව, පැරකුම්බා සිරිත මුල්ම ප්‍රශස්ති කාව්‍ය ලෙස පිළිගැනෙන බව, මෙම කවි ගායනය කරන්නෝ වන්දිභට්ටයන් ලෙස හඳුන්වන බව, පවන ශෘංගාලංකාරය, ශ්‍රී නාමය වශයෙන් ප්‍රශස්ති කාව්‍ය පවතින බව, රාජ ප්‍රශස්ති, බුද්ධ ප්‍රශස්ති, දේව ප්‍රශස්ති ලෙස වර්ගීකරණය වී ඇති බව, ප්‍රශස්ති කාව්‍ය වඩාත් ජනප්‍රිය වී ඇත්තේ මහනුවර යුගයේදී බව, කවිකාර මඩුවේදී ගායනා කර ඇති බව, ප්‍රශස්ති කවි පද උදාහරණ වශයෙන් ලියා තිබීම. ආදී කරුණු වලින් හතරක් වත් ලියා තිබේ නම් ( ලකුණු - 04 )

**II ද්‍රවිඩ ගැමි නැටුම්**

හින්දු ආගම හා බැඳි දෙමළ සංස්කෘතිය තුළ ගැමි නැටුම් දක්නට ලැබෙන බව / සෙම්බු, කෝලාට්ටම්, පින්නල් කෝලාට්ටම්, අරවි වෙට්ටු සුළකු, කාවඩි, කරගම් නමින් ද්‍රවිඩ ගැමි නැටුම් වර්ග තිබෙන බව / ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම ගැමි නැටුම් සඳහා සහභාගි වන බව / දේව භක්තිය ප්‍රකාශ කිරීම, දේව ආශිර්වාදය ලබා ගැනීම සඳහා කරගම්, කාවඩි ආදි ගැමි නැටුම් පවත්වන බව / මුරුගන් දෙවියන්, කන්නගී ආදි දෙවිවරු පුද ලබන බව / තවිල් බෙරය, නාදස්වරම් වාද්‍ය භාණ්ඩ භාවිතා කරන බව / රංග වස්ත්‍රාභරණ ආදිය ලියා තිබීම. ආදි කරුණු හතරක් වත් ලියා තිබේ නම් ලකුණු - 04

**III මණිපූරි රංග වස්ත්‍රාභරණ**

**කාන්තා ඇඳුම් පැළඳුම්**

කුමින් - ඉන සිට වළලුකර තෙක් දිග බැරලයක ආකෘතියක ඇති සායක් බව. එය අලංකාර කර ඇති ආකාරය සටහන් කර තිබීම.

පොශ්වාන් - කුමින් ඇඳුමට (සායට) උඩින් විනිවිද පෙනෙන දුහුල් රෙද්දෙන් මසන කෙටි සායක් බවත් එය අලංකාරව රැළි සහිත රංග වස්ත්‍ර කොටසක් බව ලියා තිබීම.

| | | |
|---|---|---|
| ක්වංගොයි | - | ඉණට පළඳින පටිය |
| රිෂම් පුරිට් | - | උඩුකයට අඳිනු ලබන විල්ලුද හැට්ටය එය අලංකාර කර ඇති අයුරු ලියා තිබීම් |
| මයිකුම් | - | හිසට පළඳින වේලය |
| කොක්තුම්බි | - | හිස් පළඳනාව |
| කුණ්ඩලානි | - | කනට පළඳින කරාබු |

**පිරිමි ඇඳුම්**

ධෝතිය / මකුට පළඳනාව / කුදොස් ........ ආදී කරුණු තුළින් පිළිතුර ලියා තිබීම (ලකුණු - 04)

**iv දළදා පෙරහැර**

මහනුවර දළදා පෙරහැර සෞන්දර්යාත්මක වටිනා කමින් යුතු විවිධ සංස්කෘතික අංග වලින් සමන්විත වන බව / කුඹල්, රන්දෝලි පෙරහැර වශයෙන් වීදි සංචාරය කරන බව / සතර දේවාල පෙරහර හා සම්බන්ධ වන බව / වාදන හා නර්තන ශිල්පීන් සුවිශේෂි අවස්ථා දක්ෂ ලෙස ඉදිරිපත් කිරීම.

පෙරහැර අලංකාර කර ගැනීම සඳහා යොදා ගන්නා මෙවලම්, පොල්පන්දම්, සැරසිලි, අලි ඇතුන් නිසා පෙරහැරෙහි ඇති චමත්කාර බව ලියා තිබීම / කප් සිටුවීමේ සිට දිය කැපීම දක්වා විවිධ චාරිත්‍ර සිදු කරන බව / විවිධ නර්තන අංග වාදන අංග පිළිබඳව සටහන් කර තිබීම. ( ලකුණු - 04 )

**V පණිභාරත මහතා**

දක්ෂ බෙර වාදකයෙකු බව/ දවුල්, තම්මැට්ටම් වාදනය පහතරට හා සබරගමු පිළිබඳව දක්ෂතා දැක් වූ බව/ සුප්‍රකට නර්තන ශිල්පිනි චන්ද්‍රලේඛා මහත්මියගේ බෙරවාදකයා වශයෙන් කටයුතු කළ බව/ 1944 ශිෂ්‍යත්වයක් ලැබ ඉන්දියාවේ ශාන්ති නිකේතයට ගොස් කථකලි මණිපූරි සම්ප්‍රදායන් හදාරා තිබෙන බව/ සෞන්දර්ය අධ්‍යන ආයතනයේ නර්තන අධ්‍යන ප්‍රධාන ලෙස කටයුතු කර ඇති බව/ විවිධ වූ නිර්මාණ ඉදිරිප.ත් කර ඇති බව . ආදි කරුණු අනුව විස්තර කර තිබේ නම්, (ලකුණු - 04)මාතෘකා තුනක් ලියා තිබීමට - (මුළු ලකුණු - 12)

04) I ආශාතාත්මක ගායනා / සිරසපාද කවි / කඩතුරා කවි / කෝල්මුර කවි / උපත් කවි යන කවි වලින් 2ක් නම් කර ඇත්නම් /අනාසාතාත්මන ගායනා / නමස්කාර / අෂ්ඨක / ශ්ලෝක / සන්න / සැහැලි / යාදිනි ආදියෙන් 2ක් නම් කර ඇත්නම් (ලකුණු 04)

II දෙවොල්ගොඩ බැසීම, අඹවිදමන, ඇත්බන්ධන, මී බන්ධන ආදියෙන් 2ක් පිළිබඳ විස්තර කර ඇත්නම්

**දෙවොල්ගොඩ බැසීම** - දෙවොල් දෙවියන් ලංකාවට පැමිණීම පිළිබඳ නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කෙරෙන බව, සතර අභිනයම යොදාගෙන සංවාද සහිතව ඉදිරිපත් කරන බව දක්වා තිබීම.

**අඹවිදමන** - පත්තිනි දේවිය අඹෙන් උපන් කථාව විස්තර කරමින්, මහලු වෙස්ගත් ඇඳුරා සක්‍රදෙවියන්ගේ වෙස්ගෙන රංගනයේ යෙදෙන බව විහිලු සංවාද සහිතව බෙර වාදන සමඟින් රංගන කාර්ය සිදු කරන බව ආදී ලෙස දක්වා ඇත්නම්. (ලකුණු 04)

III සත්ව හිංසනය / ආත්මාර්ථකාමී බව / සොයා බලා කටයුතු නොකිරීම / ඉවසීමක් නැතිකම / ආදරය කරුණාව නැතිකම. ආදිය තුළින් සිදුවන හානියත් ඒවා අවබෝධ කරගෙන සමාජයේ සැම පීවත්වුවහොත් යහපත් සමාජයක් බිහිවන ආකාරයත් කථාපුවත ඇසුරින් ලියා ඇත්නම් (ලකුණු 04)

05) I ගඩලාදෙණි විහාරයේ ආලින්දයේ පාදමේ නලඟන රූපාවලියක් ඇති බව / නටන වයන රූප මෙන්ම නලාව, උඩැක්කිය, රබාන , තාලම්පට වයන රූප ඇතිබව / බෙන්තර, ගලපාත විහාරයේ ගල් උළුවස්සේ බෙර වාදක රූප, ස්ත්‍රී රූප හා උඩරට නිළියක ගේ රූපයක් ඇති බව / කෑගල්ල දිස්ත්‍රික්කයේ අම්බුළුගල ටැම්පිට විහාරයේ ගල උලුවස්සේ නළඟන රූපයක් ඇති වග, මින් 2ක් සහ ඒ පිළිබඳ විස්තර කර ඇත්නම් (ලකුණු 04)

II 1. ලෙලදුන් නව තඹ පලුවන් පාදේ.......

2. ලෙලවන දිගු නෙත නිලුපුල සේයා...... මෙම කවිගෙන එම කවි තුළින් පිළිබිඹුවන කාන්තා ලාලිත්‍ය පිළිබඳව විස්තර කර ඇත්නම් (ලකුණු 04)

III - කෝට්ටේ යුගයේ දී VI වෙනි පරාක්‍රමබාහු රජුට කොහොඹා කංකාරියක් කළ බව කුවේණි අස්නේ සඳහන් වන බව / මහනුවර යුගයේ ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුට කොහොඹාකංකාරි ශාන්තිකර්මයක් කළ බව. සිහබා අස්නේ සඳහන් වන බව, ඒ තුළින් විස්තර කර ඇත්නම් (ලකුණු 04)

06) I B = සොකරි / C = කෝලම් (නම් කිරීමට ලකුණු - 02) / සොකරි නාටකයට අදාල කවියක් ලියා ඇත්නම් (ලකුණු 02)

II කරදිය ලෙස මුද්‍රා නාට්‍ය නම් කිරීමට (ලකුණු 01)

දේශිය නර්තන සම්ප්‍රදායන් භාවිත කර තිබීම / බටහිර බැලේ වල අභාෂය ලබා තිබීම / භාරතීය නර්තන හා මුද්‍රා භාවිතය / නිර්මාණාත්මක නර්තන, ප්‍රකාශනාත්මක චලන ආදිය භාවිතා කිරීම පිළිබඳ විස්තර කර ඇත්නම් (විස්තරයට ලකුණු - 03)

III D = කථකලි සම්ප්‍රදාය (නම් කිරීමට ලකුණු 01)

මිනික්කු, පච්චා, කත්තී, තාඩී, කාරි, ටෙප්පු විස්තර කර තිබීම. ඉතා සංකීර්ණ වේශ නිරූපණ ක්‍රමයක් බව. අංග රචනා ශිල්පියා පත්තුකාරයන් ලෙස හඳුන්වන බව ආදි කරුණු තුළින් පිළිතුර ලියා තිබීම. (ලකුණු 03) මුළු ලකුණු - 12

07) I ඉවසීම / පරාර්ථකාමීත්වය /නායකත්වය /පෞරුෂත්වය ඇතිවීම /සාරධර්ම වර්ධනය (එකිනෙකට ගෞරව කිරීම) / ආදි කරුණු තුළින් යහපත් ගුණාංග හතරක් ලියා තිබීම. (ලකුණු 04)

II නර්තනයේ ඒකාකාරී බව නැති වීම / නර්තනයේ නිර්මාණාත්මක බව තිව්‍ර වීම / රස වින්දනය දියුණු කිරීම සඳහා / නර්තන තේමාව ආලෝකමත් කිරීම හා සාර්ථක කර ගැනීම / උසස් කලා කෘතියක් බිහි කිරීම සඳහා / කථා තේමාව මුල, මැද, අග සම්බන්ධ කිරීම..... වැනි කරුණු තුළින් පිළිතුර ලියා තිබීම. (ලකුණු - 04)

III ප්‍රායෝගික නර්තන අභ්‍යාස තුළින් බෝ නොවන රෝග වැළඳීමේ අවධානම අඩුවේ. / නර්තනය, ගායනය, වාදනය තුළින් ඇතිවන මානසික තෘප්තිය පිළිබඳව ලියා තිබීම. / නායකත්වය, පෞරුෂත්වය වර්ධනය වීම / නර්තන නිර්මාණ තුළින් ඇතිවන සාමුහිකබව, ඉවසීම, පරමාර්ථකාමී බව වැනි ජීවිතයට අවශ්‍ය ගුණාංග. ලැබීම ආදී කරුණු අනුව පිළිතුර ලියා තිබීම. (ලකුණු 04) (මුළු ලකුණු 12)

PAST PAPERS WIKI


(2) www.PastPapers.WiKi (2)

Download Term Test Papers, Short Notes From One Place!

